## ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

## නිකවැරටිය.

# සම්පත් පැතිකඩ - 2020

සැකසුම

සංවර්ධන හා මෙහෙයුම් අංශය

ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය

නිකවැරටිය

**2021.03.31**

# ස්තූතිය.

නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ

සම්පත් පැතිකඩ සකස්කිරීම

සඳහා

සියලුම ආකාරයේ මග පෙන්වීම් කළ

ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම්,

සහකාර අධ්‍යක්ෂ(සැලසුම්)

යන නිලධාරි තුමන්ලා සහ

දත්ත සහ තොරතුරු ලබාදුන් වසම් භාර ආර්ථික සංවර්ධන නිලධාරි මහත්ම මහත්මීන් සහ

සියළුම ග්‍රාම නිලධාරීන්,ක්ෂේත්‍ර නිලධාරී මහත්ම මහත්මීන්ටත්,

කලාප අධ්‍යාපන කාර්යාලය, වාරිමාර්ග කාර්යාලය ඇතුළු තොරතුරු ලබාදුන් සියළු රාජ්‍ය ආයතන වලටත් ,

නන් අයුරින් උපකාර කළ සැමටත්

ස්තූතිය පුදකරන්නෙමු.

සැලසුම් හා සංවර්ධන අංශය
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
නිකවැරටිය.

# පෙරවදන

විද්‍යාත්මක තිරසාර සැලසුම් පිළියෙල කිරීමෙහි ලා දත්ත හා තොරතුරු වලට වැදගත් ස්ථානයක් හිමිවේ. එසේම එම දත්ත හා තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යාම කාලීන අවශ්‍යතාවයක් වේ. ඒ අනුව සාම්ප්‍රදායික සැළසුම් පිළියෙළ කිරීමේ පිළිවෙතින් බැහැරව ජනතාවගේ අවශ්‍යතාවන් ඉටු කිරීම සඳහා ග්‍රාමීය මට්ටමේ දත්ත හා තොරතුරු එක්රැස් කර ඒවා සම්පත් පැතිකඩක් වශයෙන් සකස් කිරීම පසුගිය වසර කිහිපයක් තිස්සේ සිදුවිය.

එසේම වාර්ෂිකව යාවත්කාලීන කරන ලද සම්පත් පැතිකඩ කොට්ඨාසයේ සංවර්ධන කාර්යන් හි උනන්දු වන සියලුම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවලට වඩාත් ඵලදායි සංවර්ධන සැළසුම් පිළියෙළ කිරීමට බෙහෙවින් මහෝපකාරී වූ බව පසුගිය වසර කිහිපය තුළ ලද අත්දැකීම් තුළින් පැහැදිළි විය.

සංවර්ධන සැළසුම් පිළියෙළ කිරීමෙහි ලා ප්‍රධාන තැනක් ගන්නා නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ටාසයේ 2020 වර්ෂය සඳහා දත්ත හා තොරතුරු එක්රැස් කර පිළියෙළ කරන ලද සම්පත් පැතිකඩ ඔබ අතට පත් කිරීමට හැකිවීම පිළිබඳ අතිශයින් සතුටු වෙමි.

එසේම සම්පත් පැතිකඩ පිළියෙල කිරීමෙහිලා අවශ්‍ය දත්ත හා තොරතුරු සැපයූ සියළු ආයතනයන්හි සියළු නිලධාරීන්ට හා පොත සකස් කළ සංවර්ධන අංශයේ සහකාර අධ්‍යක්ෂ, සංවර්ධන නිලධාරි සහ සියළු නිලධාරීන්ට ද මාගේ ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි.

ජේ.එම්.අයි.ආර්.කේ. ජයසුන්දර
ප්‍රාදේශීය ලේකම්
නිකවැරටිය
2021.03.31

# පටුන


1. හැඳින්වීම,( ඓතිහාසික පසුබිම, පරිපාලනපසුබිම,සිතියම් , ග්‍රාම නිලධාරි කොට්ඨාශ, භූගෝලීය පිහිටීම, දේශගුණය, කොට්ඨාශයේ පරිපාලන බෙදීම් ) 01 -10
2. ජනගහනය, සේවා නියුක්තිය,ආදායම,නිවාස 11-14
3. කෘෂි කර්මාන්තය, සත්ව පාලනය 15-22
4. ඉඩම් පරිහරණය 23
5. වාරි කර්මාන්තය 24
6. කර්මාන්ත 25-26
7. සංචාරක කර්මාන්ත 27
8. විදුලි පහසුකම් 28
9. පානීය ජල සම්පාදනය, සනීපාරක්ෂාව 29-31
10. .මාර්ග හා ප්‍රවාහන පහසුකම් 31
11. .තැපැල් සහ විදුලි සංදේශ සේවා 31 -32
12.සෞඛ්‍යය සේවා පහසුකම් 32-33
13.අධ්‍යාපනය 34
14.ආගමික සංස්කෘතික හා විනෝදජනක ස්ථාන 35
15. නීතිය හා සාමය. 35
16.වාණිජ ආයතන 36
17. වෙළඳපොල හා සේවා මධ්‍යස්ථාන 37
18.රාජ්‍ය නොවන සංවිධාන හා ස්වේච්ඡා සංවිධාන 38
19. යෞවන කටයුතු ක්‍රීඩා පහසුකම් හා පොදු පහසුකම් 38
20. සමාජ සුභසාධන කටයුතු 39-40
21. .පාරිසරික තොරතුරු 40-42
22..ප්‍රා.ලේ. කොට්ඨාසයේ රාජ්‍ය ආයතන 43
23. කොට්ඨාසයේ සංවර්ධන විභවතා 44
24. සංවර්ධන වැඩසටහන් 45

25 .ඇමුණුම් 46 -99
ඇමුණුම 01 - ජනගහන ව්‍යාප්තිය -ජාතිය අනුව 46
ඇමුණුම 02 - ජනගහන ව්‍යාප්තිය -ආගම අනුව 47
ඇමුණුම 03- ජනගහන ව්‍යාප්තිය - වයස් ඛාණ්ඩ අනුව 48
ඇමුණුම 04 - අධ්‍යාපන මට්ටම අනුව ජනසංඛ්‍යාව 49
ඇමුණුම 05 - අධ්‍යාපන මට්ටම් පදනම් කරගත් සේවා නියුක්තිය 50
ඇමුණුම 06 - අධ්‍යාපන මට්ටම් පදනම් කරගත් සේවා වියුක්තිය 51
ඇමුණුම 07- රැකියාවන්ගේ බෙදීයාම ආංශික වශයෙන් 52
ඇමුණුම 08 - විදේශ රැකියා 53
ඇමුණුම 09 - පුහුණු ශ්‍රමයේ සේවා නියුක්තිය 54
ඇමුණුම 10 - නිවාසවල ස්වභාවය 55
ඇමුණුම 11 - නිවාසවල අයිතිය (පවුල් ඒකක) 56
ඇමුණුම 12 - ඉඩම් අයිතියේ ස්වභාවය (පවුල් ගණන) 57 -58
ඇමුණුම 13 - කොට්ඨාසයේ පිහිටා ඇති වැව් සහ අමුණු 59 -66
ඇමුණුම 14 - කෘෂි ළිං 67
ඇමුණුම 15 - ගෘහ කර්මාන්ත 68 -69
ඇමුණුම 16 - විදුලිබල පහසුකම් ව්‍යාප්ත වී ඇති අයුරු 70
ඇමුණුම 17 - පානීය ජල සම්පාදන ප්‍රභවය අනුව 71
ඇමුණුම 18 - ක්‍රියාත්මක පානීය ජල යෝජනා ක්‍රම 72-74
ඇමුණුම 19- සනීපාරක්ෂාව 75
ඇමුණුම 20 - මාර්ග බෙදියාම 76
ඇමුණුම 21 - ප්‍රවාහන පහසුකම් 77
ඇමුණුම 22 - විදුලි සංදේශ පහසුකම් 78
ඇමුණුම 23 - පෙර පාසල් 79
ඇමුණුම 24 - දිවා සුරැකුම් මධ්‍යස්ථාන 80
ඇමුණුම 25 - දහම් පාසල් 81
ඇමුණුම 26 - ආගමික සිද්ධස්ථාන 82-83
ඇමුණුම 27 - සංස්කෘතික මධ්‍යස්ථාන හා කලායතන 84
ඇමුණුම 28- කොට්ඨාසයේ සිවිල් ආරක්ෂක කමිටු 85

ඇමුණුම 29 i- ix නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්වේච්ඡා සංවිධාන 86-99

# හැදින්වීම.

පුරාණයේ සිටම කෘෂිකර්මාන්තයට හිමිකම් කියන මෙම පළාත අතීතයේ බැදි වැව් අමුණු ඇල වේලි මෙන්ම ප්‍රදේශයට සශ්‍රීකත්වය ගලා එන දැදුරු ඔයෙන්ද පෝෂණය ලබන්නේය. කුඹුරු අක්කර දහස් ගණනකින් යුක්ත මෙම ප්‍රදේශයට පොල් වගාවෙන්ද අනිකුත් අතුරු භෝග සහ සත්ත්ව පාලනයෙන්ද සාර්ථක ඵලදාවක් පෙන්නුම් කෙරේ.

වර්ග කිලෝමීටර් 313 ක් පමණ විශාලත්වයකින් යුතු මෙම කොට්ඨාසය වසම් 42 කින් සමන්විත වන අතර එය ගම්මාන 105 කින් නිර්මාණය වී ඇත. එහි නිවාස 12,832ක වාසය කරන ජනගහනය 47,651කි. මෙම නිවාසවලින් 406ක් අර්ධ ස්ථිර හා 136ක් තාවකාලික මට්ටමේ පවතින අතර තවමත් විදුලිය ලැබී නොමැති නිවාස සංඛ්‍යාව 190කි.

ප්‍රදේශය පුරා මාර්ග කිලෝමීටර් 668.1ක් දිවෙන අතර එයින් මාර්ග කිලෝමීටර් 484ක් නගරයෙන් ගම් කරා පිවිසෙන සී.ඩී.හා ඊ. ශ්‍රේණියට අයත් මාර්ග වේ.

## 1.1ඓතිහාසික පසුබිම

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත්පත්තුවේ මාගුල් ඕතොට කෝරළයේ ඇති නිකවැරටිය කොට්ඨාසය ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථානයක් උසුලයි. මෙහි සංස්කෘතිමය වටිනාකමකින් යුතු බෞද්ධ විහාරස්ථාන 22 ක් පමණ දක්නට ඇත. මෙහිදී විශේෂයෙන් බුදුමුත්තාව රජමහා විහාරය විශේෂ තැනක් හිමිකර ගනී. බුදුමුත්තාව විහාරයේ ආරම්භ අතීතය පඩුවස්දෙව් (ක්‍රි.ව.5 )රජ සමයට තරම් ඈත අතීතයට ගමන් කරන බව ඒ හා බැදුණු ජනප්‍රවාද තහවුරු කරයි. ඒ අනුව බුදුන් වහන්සේ ජීවමාන සමයේ ඇතිවූ සංහාරය අවස්ථාවේ (නිබ්බුත පද අසා කිසාගෝතමියට පරිත්‍යාග කළ) මුක්තාභරණය පිළිබඳව ජනප්‍රවාදයෙහි එන තොරතුරු අනුව එය තැම්පත් කර වෙහෙරක් කරවා මල් පහන් පූජා කර ඇති අතර එය බුදුමුත්තාගර ලෙසද පසුව බුදුමුත්තාව ලෙසද ව්‍යවහාරයට එක්ව ඇත. එම ජනප්‍රවාදයට සම්බන්ධව දණ්ඩු ශාක්‍ය හා තෘණ ශාක්‍ය යන දෙදෙනා එක්ව වැවක් තැනූ බවත් ගොවිතැන් කළ බවත් රිදී කැට දාහක් වියදම් කර දැදුරු ඔයෙන් වැවට වතුර ගැනීමට ජල මාර්ගයක් සැකසූ බවත් කියවේ. එය රිදී බැදි ඇල්ල නම් වේ. පසුව මහසෙන් රජ සමයේ වැව විශාල කර මාගල්ලේ වැව ලෙස නම් කර ඇත. මීට අමතරව මෙම විහාරස්ථානයේ දී හමු වුන පුරාවස්තු පැහැදිලි ලෙසම ක්‍රි.ව. 8 වන සියවසට අයත් වේ. බුදුමුත්තාව විහාරස්ථානයේ දක්නට ඇති පැරණි විහාර මන්දිරය මහනුවර යුගයේ වාස්තු විද්‍යාව ප්‍රකට කරයි. බුදුමුත්තාව යන නම සකස් වූ ආකාරය ගැන මහාචාර්ය පරණවිතානයන්ගේ මතය නම් අය බදු ගැනීමෙන් මුදා හරින ලද ප්‍රදේශය,බදු මුක්ත ප්‍රදේශය යන අදහස බවයි.



## 1.2 පරිපාලන පසුබිම

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය මැතිවරණ කොට්ඨාසය කොටවෙහෙර,රස්නායකපුර, කොබෙයිගනේ සහ නිකවැරටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 04 න් සමන්විතව පිහිටා ඇත. නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ග්‍රාම නිලධාරි වසම් 42 න් සහ ගම්මාන 105 න් සමන්විත වේ. නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පැරණි පරිපාලන බෙදීම් අනුව මාගුල් ඕතොට කෝරලය සහ මාගුල් මැදගත් 10 බටහිර කෝරලය වශයෙන් හඳුන්වන ලදී.නිකවැරටිය මැතිවරණ කොට්ඨාසයේ ප්‍රධාන නාගරික කේන්ද්‍රය නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටීම විශේෂයෙන් වැදගත්වේ. නිකවැරටිය නගරය කේන්ද්‍ර කරගනිමින් රජයේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය වශයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කරන අතර නිකවැරටිය ප්‍රාදේශීය සභාව, පොලිස්

ස්ථානය, උසාවිය,මූලික රෝහල ,කළාප අධ්‍යාපන කාර්යාලය,වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය,පශු වෛද්‍ය කාර්යාලය,වනජීවී කාර්යාලය, යන ආයතන මහජන සේවා සැපයීමේ කටයුතු සිදු කරනු ලබයි. ප්‍රදේශයේ ආර්ථික හා වාණිජ කටයුතු පහසුකරණය සඳහා ලංකා බැංකුව,මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව යන රාජ්‍ය බැංකු ඇතුළුව පෞද්ගලික බැංකු 5 ට අධික ප්‍රමාණයක් සේවා සැපයීම් සිදු කරමින් පවතී. ප්‍රදේශයේ ජනතාවගෙන් බහුතරය කෘෂිකර්මාන්තය ජීවනෝපාය කරගෙන දිවිගෙවන පිරිසක් වීමත් ඒ හා සම්බන්ධ මූල්‍ය හා අනෙකුත් ප්‍රාග්ධන අවශ්‍යතා සම්පාදනයෙහිලා මෙම මූල්‍ය ආයතන විසින් සැලකිය යුතු මෙහෙවරක් ඉටු කරනු ලබයි.මෙයට අමතරව ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් මහජනතාවගේ පරිපාලන අවශ්‍යතා ඉටු කිරීම උදෙසා ග්‍රාම නිලධාරී, සංවර්ධන නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී,කෘෂි පර්යේෂණ නිලධාරී,පවුල් සෞඛ්‍ය නිලධාරී ඇතුළුව ක්ෂේත්‍රමට්ටමින් රාජකාරි ඉටු කරන නිලධාරීන් 48 ක පිරිසක් සේවය සපයනු ලබයි. නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල සමාජ සංවර්ධනය සහ සහජීවනය ගොඩනැංවීමේ ක්‍රියාදාමයේ දී ඉහතින් සඳහන් කල නිලධාරීන් හා සේවා සපයන ආයතන විසින් ඉටු කරනු ලබන මෙහෙවර බෙහෙවින් වැදගත් වන බව සඳහන් කල යුතු වේ.

**02**

## 1.3 ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පිහිටීම






## 1.4 ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පරිපාලන මායිම්






**1.5 ග්‍රාම නිලධාරී කොට්ඨාස භූමි ප්‍රමාණය හා ගම් සංඛ්‍යාව**

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නම | භූමි ප්‍රමාණය හෙක්ටයාර් | ගම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **1.** | *283* | *හීලෝගම* | 371.70 | **1** |
| **2.** | *284* | *කැබැල්ලෑව* | 400.03 | **1** |
| **3.** | *286* | *කළුවැන්නෑව* | 198.40 | **2** |
| **4.** | *287* | *දණ්ඩුවාව* | 206.34 | **1** |
| **5.** | *288* | *තරණගොල්ල* | 300.57 | **1** |
| **6.** | *289* | *ප/ගලපිටියාගම* | 214.67 | **4** |
| **7.** | *293* | *නික/උතුර* | 167.00 | **2** |
| **8.** | *294* | *නික/දකුණ* | 148.00 | **1** |
| **9.** | *295* | *විහාරගම* | 282.77 | **2** |
| **10.** | *296* | *මාගල්ලේගම* | 213.76 | **1** |
| **11.** | *297* | *මිල්ලගොඩ* | 205.60 | **2** |
| **12.** | *298* | *- දියගම* | 270.80 | **2** |
| **13.** | *299* | *හැවැන්පැලැස්ස* | 229.23 | **1** |
| **14.** | *300* | *කිවුලේගම* | 276.00 | **3** |
| **15.** | *301* | *නබඩෑව* | 529.60 | **2** |
| **16.** | *302* | *තුඹුල්ල* | 432.70 | **5** |
| **17.** | *304* | *- ගලපිටියාගම* | 251.80 | **1** |
| **18.** | *305* | *හාතිගම්මන* | 255.17 | **2** |
| **19.** | *306* | *බුදුමුත්තාව* | 254.48 | **1** |
| **20.** | *307* | *ඔලුපැලියාව* | 449.56 | **3** |
| **21.** | *308* | *- වදුරුස්ස* | 321.50 | **3** |
| **22.** | *309* | *කන්දෙගෙදර* | 542.00 | **3** |
| **23.** | *310* | *හුලුගල්ල* | 494.00 | **2** |
| **24.** | *311* | *ගලගෙදර* | 470.00 | **4** |
| **25.** | *312* | *දලුක්ගොල්ල* | 247.20 | **3** |
| **26.** | *313* | *කරකොලේ* | 134.00 | **3** |
| **27.** | *314* | *ඉහකොළගම* | 380.40 | **2** |
| **28.** | *315* | *තිඹිරියාව* | 628.00 | **8** |
| **29.** | *316* | *හල්මිල්ලෑව* | 358.00 | **1** |
| **30.** | *317* | *ඔ/දිවුල්ලෑව* | 529.60 | **3** |
| **31.** | *318* | *කුඹුක්වැව* | 259.60 | **1** |
| **32.** | *319* | *කටගමුව* | 260.00 | **1** |
| **33.** | *320* | *ඇලවක* | 372.00 | **2** |
| **34.** | *321* | *හුලෝගෙදර* | 445.10 | **3** |
| **35.** | *322* | *රන්දෙනිගම* | 546.00 | **3** |
| **36.** | *323* | *බෝගොල්ලාගම* | 330.53 | **3** |
| **37.** | *324* | *මාවතගම* | 352.40 | **5** |
| **38.** | *325* | *පින්නපොලේගම* | 428.50 | **2** |
| **39.** | *326* | *සියඹලෑව* | 515.20 | **5** |
| **40.** | *327* | *කිරිදිගල්ල* | 997.15 | **4** |
| **41.** | *328* | *වාසිවැව* | 369.20 | **2** |
| **42.** | *329* | *දිවුල්ලෑගොඩ* | 598.23 | **4** |
| **එකතුව** | | | 15236.79 | **105** |

## 1.6ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ මාර්ග සිතියම



## 1.7 භූගෝලීය පිහිටීම

නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත්තේ වයඹ පළාතට අයත් කුරුණෑගල දිස්ත්‍රික්කයේය. කුරුණෑගල සිට පුත්තලම දක්වා මාර්ගයේ කිලෝමීටර 40 ක් පමණ එන විට මෙම කොට්ඨාසයේ ප්‍රධාන නගරය මෙන්ම වෙළඳ මධ්‍යස්ථානය වන නිකවැරටිය නගරය හමුවේ.

දැදුරු ඔයේ සීමාවෙන් දකුණු දෙස කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නැගෙනහිර මායිම වන්නේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි.උතුරු මායිම කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සීමා වන අතර බටහිර මායිම වන්නේ රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයි.

නිකවැරටිය කොට්ඨාසය ලංකාවේ දෙවැනි විශාලතම මැතිවරණ කොට්ඨාසය වන අතර එහි විශාත්වය දෙවැනි වන්නේ මොණරාගල මැතිවරණ කොට්ඨාසයට පමණි.මෙහි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 04 ක් පිහිටා ඇත. නිකවැරටිය, කොබෙයිගනේ, කොටවෙහෙර, රස්නායකපුර එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වේ.

## 1.8 ජල සම්පත්

නැගෙනහිර සිට බටහිරට ගලා යන දැදුරු ඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම වන අතර එය ප්‍රදේශයේ ප්‍රධානතම සම්පත වේ. නිකවැරටිය මාගල්ලේ වැවට ජලය සපයනු ලබන්නේ දැදුරු ඔය හරස් කර සාදා ඇති රිදීබැදි ඇළ මාර්ගයෙනි. ඊට අමතරව ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතුවලට දායකවන වැව් අමුණු 391ට අධික ප්‍රමාණයක් ඇත.

## 1.9 පසෙහි ස්වභාවය

කොට්ඨාසයේ පසේ ස්වභාවය පිළිබඳව සැලකිලිමත් වීමේදී පෙනී යන කරුණක් වන්නේ එහි ස්වභාවය තරමක් විවිධත්වයකින් යුතු බවයි.දිවුල්ලැගොඩ, වාසිවැව වැනි ප්‍රදේශවල මතුපිට කළුගල් කබොක් සහිත මැටි පසක් දක්නට ඇත. හුලුගල්ල ,රඹපොකුණ තදාසන්න ප්‍රදේශවල මකුල්ල පස දක්නට ඇත. උස් සහිත ප්‍රදේශයන්හි වියළි ස්වභාවයක් උසුලයි. තැනිතලා බිම් බහුල ප්‍රදේශයකි.

## 1.10 දේශගුණය

### 1.10.1. වර්ෂාපතනය අගයන් (මිලි මීටර්)

| මාසය | අදාල වර්ෂ | | | |
|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 |
| ජනවාරි | 165.00 | 0.70 | 0.0 | 0.0 |
| පෙබරවාරි | 3.00 | 114.00 | 92.9 | 2.0 |
| මාර්තු | 106.00 | 29.00 | 19.5 | N A |
| අප්‍රේල් | 8.00 | 202.00 | 317.1 | 167.2 |
| මැයි | 114.00 | 430.00 | 0.0 | 101.5 |
| ජූනි | 81.00 | 95.00 | 75.0 | 62.5 |
| ජූලි | 8.00 | 20.00 | 5.2 | 32.6 |
| අගෝස්තු | 30.00 | 6.00 | 126.1 | 48.9 |
| සැප්තැම්බර් | 284.00 | 221.00 | 116.8 | 266.5 |
| ඔක්තෝබර් | 210.00 | 421.00 | 483.6 | N A |
| නොවැම්බර් | 225.00 | 155.00 | 140.5 | N A |
| දෙසැම්බර් | 124.00 | 83.00 | 149.8 | N A |
| **එකතුව** | **1358.00** | **1776.7** | **1526.5** | |

### 1.10.2. උෂ්ණත්වය අගයන් (සෙ. අං. )

| මාසය | අදාල වර්ෂ | | | |
|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 |
| ජනවාරි | 26.1 | 26.20 | 26.2 | 22.1 |
| පෙබරවාරි | 26.5 | 28.20 | 28.3 | 22.6 |
| මාර්තු | 28.2 | 29.00 | 29.45 | 23.8 |
| අප්‍රේල් | 29.7 | 28.90 | 29.75 | 23.8 |
| මැයි | 29.1 | 27.90 | 29.95 | 24.7 |
| ජූනි | 28.4 | 28.00 | 28.9 | 25.1 |
| ජූලි | 28.9 | 28.10 | 28.5 | 24.6 |
| අගෝස්තු | 28.6 | 27.80 | 27.7 | 24.6 |
| සැප්තැම්බර් | 27.8 | 28.80 | 27.75 | 24.2 |
| ඔක්තෝබර් | 27.7 | 27.40 | 26.95 | 24.4 |
| නොවැම්බර් | 27.1 | 26.90 | 27.7 | N A |
| දෙසැම්බර් | 26.7 | 26.40 | 26.65 | 22.8 |
| **එකතුව** | **334.8** | **333.6** | **337.8** | |

## 1.11 කොට්ඨාශයේ පරිපාලන හා සංවර්ධන සම්බන්ධයෙන් කර ඇති බෙදීම්

### 1.11.i ග්‍රාම නිලධාරී වසම් අනුව කෝරළ බෙදීම්

| අනු අංකය | ග්‍රාමනිලධාරි අංකය හා වසම | කෝරළ බෙදීම් |
|---|---|---|
| 1. | 283 - හීලෝගම | මාගුල් මැදගන් 10 බටහිර |
| 2. | 284 - කැබැල්ලෑව | |
| 3. | 286 - කළුවැන්නෑව | මගුල් ඕතොට කොරලේ |
| 4. | 287 - දණ්ඩුවාව | මාගුල් මැදගන් 10 බටහිර |
| 5. | 288- තරණගොල්ල | |
| 6. | 289 - ප/ගලපිටියාගම | |
| 7. | 293 - නික/උතුර | මගුල් ඕතොට කොරලේ |
| 8. | 294 - නික/දකුණ | |
| 9. | 295- විහාරගම | |
| 10. | 296- මාගල්ලේගම | |
| 11. | 297- මිල්ලගොඩ | |
| 12. | 298 - දියගම | |
| 13. | 299 - හැවැන්පැලැස්ස | |
| 14. | 300 - කිවුලේගම | |
| 15. | 301- නබඩෑව | |
| 16. | 302 - තුඹුල්ල | |
| 17. | 304 - ගලපිටියාගම | |
| 18. | 305 - හාතිගම්මන | |
| 19. | 306 - බුදුමුත්තාව | |
| 20. | 307 - ඔලුපැලියාව | |
| 21. | 308 - වදුරුස්ස | |
| 22. | 309 - කන්දෙගෙදර | |
| 23. | 310 - හුලුගල්ල | |
| 24. | 311 - ගලගෙදර | |
| 25. | 312 - දලුක්ගොල්ල | |
| 26. | 313 - කරකොලේ | |
| 27. | 314 - ඉහකොළගම | |
| 28. | 315- තිඹිරියාව | |
| 29. | 316- හල්මිල්ලෑව | |
| 30. | 317 - ඕ/දිවුල්ලෑව | |
| 31. | 318 - කුඹුක්වැව | |
| 32. | 319 - කටගමුව | |
| 33. | 320 - ඇලවක | |
| 34. | 321 - හුලෝගෙදර | |
| 35. | 322 - රන්දෙනිගම | |
| 36. | 323 - බෝගොල්ලාගම | |
| 37. | 324 - මාවතගම | |
| 38. | 325- පින්නපොලේගම | |
| 39. | 326- සියඹලෑව | |
| 40. | 327- කිරිදිගල්ල | |
| 41. | 328 - වාසිවැව | |
| 42. | 329 - දිවුල්ලෑගොඩ | |

## 1.11.ii සමෘද්ධි කලාප

| අනු අංකය | ග්‍රාමනිලධාරි අංකය හා වසම | සමෘද්ධි කලාප |
|---|---|---|
| 1. | 293 - නික/උතුර | |
| 2. | 294 - නික/දකුණ | |
| 3. | 295- විහාරගම | |
| 4. | 296- මාගල්ලේගම | |
| 5. | 297- මිල්ලගොඩ | |
| 6. | 316- හල්මිල්ලැව | |
| 7. | 317 - ඕ/දිවුල්ලැව | |
| 8. | 318 - කුඹුක්වැව | |
| 9. | 319 - කටගමුව | |
| 10. | 320 - ඇලවක | |
| 11. | 322 - රන්දෙනිගම | |
| 12. | 326- සියඹලැව | |
| 13. | 327- කිරිදිගල්ල | |
| 14. | 328 - වාසිවැව | |
| 15. | 329 - දිවුල්ලැගොඩ | නිකවැරටිය |
| 16. | 283 - හීලෝගම | |
| 17. | 284 - කැබැල්ලැව | |
| 18. | 286 - කළුවැන්නැව | |
| 19. | 287 - දණ්ඩුවාව | |
| 20. | 288- තරණගොල්ල | |
| 21. | 289 - ප/ගලපිටියාගම | |
| 22. | 298 - දියගම | |
| 23. | 299 - හැවැන්පැලැස්ස | |
| 24. | 300 - කිවුලේගම | |
| 25. | 301- නබඩැව | |
| 26. | 302 - තුඹුල්ල | |
| 27. | 304 - ගලපිටියාගම | |
| 28. | 305 - හාතිගම්මන | |
| 29. | 306 - බුදුමුත්තාව | හැවැන්පැලැස්ස |
| 30. | 307 - ඔලුපැලියාව | |
| 31. | 308 - වදුරැස්ස | |
| 32. | 309 - කන්දෙගෙදර | |
| 33. | 310 - හුලුගල්ල | |
| 34. | 311 - ගලගෙදර | |
| 35. | 312 - දලුක්ගොල්ල | |
| 36. | 313 - කරකොලේ | |
| 37. | 314 - ඉහකොළගම | |
| 38. | 315- තිඹිරියාව | |
| 39. | 321 - හුලෝගෙදර | |
| 40. | 323 - බෝගොල්ලාගම | |
| 41. | 324 - මාවතගම | |
| 42. | 325- පින්නපොලේගම | ඉහකොළගම |

## 1.11.iii උප්පැන්න මරණ රෙජිස්ටාර් කොට්ඨාශ - 02

- මගුල් ඕතොට කොරලේ
- මාගුල් මැදගත් 10 බටහිර

## 1.11.iv විවාහ රෙජිස්ටාර් කොට්ඨාශ -01

- වන්නි හත්පත්තුව

## 2. ජනගහනය/සේවා නියුක්තිය/ආදායම/නිවාස

### 2.1 මුළු ජනගහනය

| ස්ත්‍රී | පුරුෂ | එකතුව |
|---|---|---|
| 24644 | 23007 | 47651 |

### 2.2 ජනගහන ව්‍යාප්තිය-ජාතිය අනුව

| සිංහල | ශ්‍රීලාංකීය දෙමළ | ඉන්දියානු දෙමළ | මුස්ලිම් | මැලේ | බර්ගර් | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 45572 | 414 | 03 | 1662 | 0 | 0 | 0 | 47651 |

**ඇමුණුම-01 ජනගහන ව්‍යාප්තිය (ජාතිය අනුව)**

### 2.3 ජනගහන ව්‍යාප්තිය-ආගම් අනුව

| බෞද්ධ | කතෝලික | ක්‍රිස්තියානි | ඉස්ලාම් | හින්දු | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 44946 | 534 | 128 | 1703 | 340 | 0 | 47651 |

**ඇමුණුම-02 ජනගහන ව්‍යාප්තිය (ආගම් අනුව)**

### 2.4 ජනගහන ව්‍යාප්තිය වයස් කාණ්ඩ අනුව

| අවුරුදු 5 හා 5 ට අඩු | | අවුරුදු 6-18 | | අවුරුදු 19-60 | | අවුරුදු 60 වැඩි | | එකතුව | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | |
| 1959 | 1860 | 4894 | 4703 | 13783 | 13281 | 4008 | 3163 | 24644 | 23007 | 47651 |

**ඇමුණුම-03ජනගහන ව්‍යාප්තිය (වයස් කාණ්ඩ අනුව)**

### 2.5 ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ජනසනත්වය (වර්ග කි.මී.1 ජනගහනය)

| 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| 302 | 305 | 306 | 307 |

## 2.6 අධ්‍යාපන මට්ටම අනුවජන සංඛ්‍යාව

| අනුඅංකය | අධ්‍යාපන මට්ටම | ජන සංඛ්‍යාව | ප්‍රතිශත ය |
|---|---|---|---|
| 1 | අවු 5ට අඩු | *3609* | 7.57 |
| 2 | කිසිදාපාසල් නොගිය | *1025* | 2.15 |
| 3 | ප්‍රාථමික (1-5 ) වසර | *7384* | 15.50 |
| 4 | ද්විතීයක (6-11) වසර | *17220* | 36.14 |
| 5 | සා/පෙළ සමත් | *9630* | 20.21 |
| 6 | උ/පෙළ සමත් | *7128* | 14.96 |
| 7 | ඩිප්ලෝමාධාරි | *283* | 0.59 |
| 8 | උපාධි - i භෞතිකවිද්‍යා | *23* | 0.05 |
| | ii ජීව විද්‍යා | *51* | 0.11 |
| | iiiවාණිජ | *168* | 0.35 |
| | ivකලා | *1069* | 2.24 |
| 9 | පශ්චාත්උපාධි | *32* | 0.07 |
| 10 | වෙනත් | *29* | 0.06 |
| **එකතුව** | | **47651** | **100** |

ඇමුණුම 04- අධ්‍යාපනමට්ටම් අනුව ජන සංඛ්‍යාව

## 2.7 අධ්‍යාපන මට්ටම පදනම් කරගත් සේවා නියුක්තිය

| 8 ශ්‍රේණිය සමත් | | අ.පො.ස (සා/පෙළ) සමත් | | අ.පො.ස (උ/පෙළ) සමත් | | ඩිප්ලෝමාධාරි | | උපාධිධාරි | | මුළුඑකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ |
| 1827 | 2836 | 2573 | 3488 | 2287 | 2669 | 157 | 113 | 807 | 543 | 7651 | 9649 |

ඇමුණුම **05-** අධ්‍යාපන මට්ටම පදනම් කරගත් සේවා නියුක්තිය

## 2.8අධ්‍යාපන මට්ටම පදනම් කරගත් සේවා වියුක්තිය

| 8 ශ්‍රේණිය සමත් | | අ.පො.ස (සා/පෙළ) සමත් | | අ.පො.ස (උ/පෙළ) සමත් | | ඩිප්ලෝමාධාරි | | උපාධිධාරි | | මුළුඑකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2940 | 2012 | 2172 | 1271 | 1441 | 823 | 23 | 28 | 37 | 21 | 6613 | 4155 |

ඇමුණුම **06-** අධ්‍යාපන මට්ටම පදනම් කරගත් සේවා නියුක්තිය



## **2.9 රැකියාවන්ගේ බෙදී යාම ආංශික වශයෙන්**

| රාජ්‍ය අංශය | අර්ධ රාජ්‍ය | පෞද්ගලික අංශය | කෘෂි කාර්මික කටයුතු | ස්වයං රැකියා | විදේශ රැකියා | පතල් වැඩ, වතු වැඩ, කුලී වැඩ හා වෙනත් | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 4567 | 754 | 4484 | 6738 | 1637 | 695 | 3432 | 992 | 23299 |

ඇමුණුම **07** රැකියාවන්ගේ බෙදී යාම ආංශික වශයෙන්

## **2.10 විදේශ රැකියා**

| විදේශ රැකියා | ලියාපදිංචි වී විදේශ ගතවූ සංඛ්‍යාව | ලියාපදිංචි නොවී විදේශ ගතවූ සංඛ්‍යාව |
|---|---|---|
| 1. පුහුණු ශ්‍රමිකයන් | 170 | - |
| 2. නුපුහුණු ශ්‍රමිකයන් | - | - |
| I. ගෘහ සේවිකා | 410 | 1 |
| වෙනත් | 121 | - |
| 3.වෘත්තීය වේදීන් | 17 | - |
| | - | - |

ඇමුණුම **08** විදේශ රැකියා

## **2.11 පුහුණු ශ්‍රමයේ සේවා නියුක්තිය**

| අනුඅංකය | සේවා නියුක්තිඅංශයන් | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පරිගණක | 303 |
| 2 | පෙදරේරු | 483 |
| 3 | රියදුරු | - |
| | 1 බර වාහන | 303 |
| | 11 සැහැල්ලු වාහන | 350 |
| | 111 ත්‍රීවිල් | 247 |
| 4 | වඩුකාර්මික | 317 |
| 5 | ඉලෙක්ට්‍රෝනික් යන්ත්‍ර අලුත් වැඩියාව | 114 |
| 6 | මැණික්කැපීම | 0 |
| 7 | පෙර පාසල්ගුරු පුහුණුව | 57 |
| 8 | යතුරුලියනය | 9 |
| 9 | මැහුම්නැටුම් | 394 |
| 10 | ජුකීපුහුණුව | 422 |
| 11 | ගෘහනිර්මාණ ශිල්පය | 12 |
| 12 | ක්‍රීඩා | 19 |
| 13 | ස්වර්ණාභරණසෑදීම | 40 |
| 14 | වෙළදාම | 1143 |
| 15 | මෝටර්කාර්මික | 140 |
| 16 | සෞඛ්‍ය | 203 |
| 17 | තැපැල් | 39 |
| 18 | රූපලාවණ්‍ය | 63 |
| 19 | එම්බ්‍රොයිඩර් | 16 |

| | | |
|---|---|---|
| 20 | විදුලිකාර්මික | 98 |
| 21 | මාධ්‍යවේදින් | 5 |
| 22 | වෙනත් | 559 |

**ඇමුණුම 09 -පුහුණු ශ්‍රමයේ සේවා යුක්තිය**



## 2.12 පවුලක සාමාන්‍ය ආදායම (මාසික)

| ආදායම (රු) | මුළු පවුල්සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| 10000 ට අඩු | **6437** | 32.6 |
| 10001-20000 | 2001 | 15.1 |
| 20001-30000 | 1360 | 10.0 |
| 30001-40000 | 1955 | 14.4 |
| 40001-50000 | 1225 | 9.3 |
| 50001-60000 | 832 | 6.4 |
| 60001-70000 | 588 | 4.6 |
| 70001-80000 | 471 | 3.8 |
| 80000 වැඩි | 495 | 3.6 |
| එකතුව | **15,364** | 100 |

## 2.13 නිවාස වල ස්වභාවය/අයිතිය

| ස්ථිර | අර්ධ ස්ථිර | තාවකාලික | එකතුව |
|---|---|---|---|
| 12290 | 406 | 136 | 12832 |

**ඇමුණුම10 - නිවාස වල ස්වභාවය**

## 2.14නිවාස වල අයිතිය (පවුල් ඒකක)

| තමාගේම නිවසක් හිමි | හවුල් පදිංචි | කුලියට/බද්ධටපදිංචි | අනවසර ඉඩම්වලපදිංචි | රජයේ නිල නිවාසවලපදිංචි | පදිංචියට නිවස ක්නැති | එකතුව |
|---|---|---|---|---|---|---|
| 12571 | 1997 | 112 | 132 | 17 | 535 | 15364 |

**ඇමුණුම11 - නිවාස වල අයිතිය (පවුල් ඒකක)**

## 2.15නිවාස පහසුකම්

| අනු අංකය | නිවාස යෝජනාක්‍රමයේ නම | නිවාස සංඛ්‍යාව | ආධාර සැපයු /ක්‍රියාත්මක කළ ආයතනය |
|---|---|---|---|
| 01 | රණවිරු ගම්මානය (බෝගොල්ලාගම) | 13 | ආරක්ෂක අමාත්‍යංශය |
| 02 | සැමට සෙවන ගම්උදා වැඩසටහන(සෝගම් යාය-316 හල්මිල්ලෑව ) | 25 | නිවාස සං අධිකාරිය |
| 04 | හැවැන්පැලැස්ස ඇන්නරුගම නිවාස යෝජනාක්‍රමය (හාතිගම්මනහා දියගම) | 22 | නිවාස සං අධිකාරිය |
| 05 | රාජ්‍ය සේවක ගම්මාන අදියර 01( 302-තුඹුල්ල) | 41 | නිවාස සං අධිකාරිය |
| 06 | රාජ්‍ය සේවක ගම්මාන අදියර 02(302-තුඹුල්ල) | 19 | නිවාස සං අධිකාරිය |

## 2.16 නිවාස යෝජනා ආරම්භ කළහැකි ස්ථාන හා ඉඩම් පිළිබඳව විස්තර

| ඉඩමේ නම | පිහිටීම | විශාලත්වය(අක්කර ) | අයිතිය |
|---|---|---|---|
| පත්කොලවැව හේන් යාය.(ජලය විදුලිය නොමැත) | 328 වාසිවැව | 15 | රජයේ |



# 3.කෘෂි කර්මාන්තය/ඉඩම්පරිහරණය

## 3.1වී වගාව

3.1.1 කොට්ඨාසයේ මුළු කුඹුරුප්‍රමාණය (හෙක්ටයාර්)– 3731.24

3.1.2 පුරන් වූ කුඹුරුප්‍රමාණය (හෙක්ටයාර්)– 3.4

3.1.3 වගා කල කුඹුරු ප්‍රමණයහා අස්වැන්න

| වගා කන්නය | | කුඹුරුප්‍රමාණය (හෙක්) | මුළු අස්වැන්න (මෙ.ටො) |
|---|---|---|---|
| 2016 | යල | 2404.31 | 9719.18 |
| | මහ | 2713.35 | 11413.29 |
| 2017 | යල | 1211.9 | 4656.26 |
| | මහ | 2628.5 | 10347.26 |
| 2018 | යල | 2258.29 | 9186.64 |
| | මහ | 3213.85 | 12521.83 |
| 2019 | යල | 1472.34 | 5923.79 |
| | මහ | 2596.43 | 14715.6 |
| 2020 | යල | 2475.25 | 10238.07 |
| | මහ | 3384 | 13176.57 |

### 3.1.4 වී වගාව සඳහා ජලය ලබා ගන්නා මාර්ග

| ජලය ලබා ගන්නා මාර්ග | වගා භූමි ප්‍රමාණය (හෙක්) | | |
|---|---|---|---|
| | මහ කන්නය | යල කන්නය | එකතුව |
| 1 මහා වාරිමාර්ග යටතේ (අක්කර අඩි 800 වැඩි) | 4578.6 | 3516.7 | 7095.3 |
| 2මධ්‍ය වාරිමාර්ග යටතේ (අක්කර අඩි 800 -200) | 247.87 | 247.87 | 495.74 |
| 3සුළු වාරි මාර්ග යටතේ (අක්කර අඩි 200 අඩු) | 2376.4 | 1507.5 | 3883.9 |
| 4අහස් දියෙන් | 291.95 | 111.75 | 403.7 |
| 5 උස්සාන වාරි | - | - | - |
| එකතුව | 7494.82 | 5383.82 | 11878.64 |

### 3.1.5 පොහොර සහනාධාර වැඩසටහන

| වගාව | පොහොර වර්ගය | ලබා දෙන ලද පොහොර ප්‍රමාණය(මෙ.ටො) | |
|---|---|---|---|
| | | යල | මහ |
| වී වගාව | යූරියා | 452.71 | 654.68 |
| | ටී.ඒස්.පී. | 57.17 | 27 |
| | එම්.ඕ.පී | 121.66 | 60.27 |

### 3.1.6 පොහොර සහනාධාර වැඩසටහන-වෙනත් වගාවන්

| වගාව | පොහොර වර්ගය | ලබා දෙන ලද පොහොර ප්‍රමාණය(මෙ.ටො) |
|---|---|---|
| අතිරේක භෝග | යූරියා | 95.08 |
| | ටී.ඒස්.පී. | 12.37 |
| | එම්.ඕ.පී | 22.385 |
| | ජී.වී.එෆ්. | **5** |
| | Special Vege able | 0.5 |
| | YPM | 1 |
| | APM | 1 |
| | | 15 |

## 3.1.7 වී වගාව සම්බන්ධව උද්ගත වී ඇති ගැටළු

1.යල මහ කන්න දෙකම වගා කිරීමට ප්‍රමාණවත් ජලය නොමැති වීම.
2.වන අලි හානිය සහ වෙනත් සතුන් ගෙන් සිදුවන හානි.
3.ස්වභාවික අනතුරු මගින් සිදුවන හානි ( ගං වතුර, නියග )
5.බිත්තර වී හිගය.
6.මූල්‍ය අපහසුතා.
7.ශ්‍රම හිගය.

## 3.1.8 වී වගාව ප්‍රවර්ධනය සඳහා කරන යෝජනා

1. දැදුරු ඔය ව්‍යාපෘති ජල යෝජනා ක්‍රමය යටතේ ජලය ලබා ගැනීමට සැලැස්මක් සකස් කිරීම.
2. නව තාක්ෂණික ක්‍රම ගොවීන්ට හදුන්වා දීම.
3. පොහොර සහනාධාරය සරල කර නිසි වේලාවට ලබාදීමට කටයුතු කිරීම.

## 3.2 භෝග වගාව
## 3.2.1 ප්‍රධාන භෝග වගාව

| වගාව | වගා කර ඇති බිම් ප්‍රමාණය (අක්) | වාර්ෂික නිෂ්පාදනය(ගෙඩි) |
|---|---|---|
| පොල් | 3423.75 | 10,077,096 |
| තේ | - | - |
| රබර් | - | - |

## 3.2.2පලතුරු බෝග වගාව

| | බෝගය | බිම් ප්‍රමාණය (අක්කර) | | වාර්ෂික නිෂ්පාදනය කි.ග්‍රෑ |
|---|---|---|---|---|
| | | තනිවගාවක් ලෙස | අතුරු බෝග වගාවක් ලෙස | |
| **1** | අන්නාසි | - | 33.15 | 127208.2 |
| **2** | කෙසෙල් | - | 102.05 | 8286784.6 |
| **3** | අඹ | - | 122.75 | 28813468.2 |
| **4** | පැපොල් | - | 56.05 | 172449.6 |
| **5** | දොඩම් | - | 61.75 | 8565563.3 |

| | | | | |
|---|---|---|---|---|
| **6** | කොමඩු | - | 20.85 | 685083 |
| **7** | කජු | - | 65.05 | 3702882.6 |
| **8** | ඩ්‍රැගන් ෆෲට් | - | 1.75 | 520.1 |
| **9** | වෙනත් | - | | |



## 3.2.3 සුළු අපනයන බෝග වගාව

| **බෝගය** | **බිම ප්‍රමාණය (අක්)** | **නිෂ්පාදනය (කි.ග්‍රෑ)** |
|---|---|---|
| ගම්මිරිස් | 32.6 | 2276.25 |
| කෝපි | - | - |
| කහ | 12 | 50500 |
| කොකෝවා | - | - |
| කරාබු නැටි | - | - |
| එනසාල් | - | - |
| කුරුඳු | - | - |
| ඉඟුරු | 15.2 | 80370 |
| බුලත් | 98.84 | 1500000 |
| පුවක් | 49.42 | 200000 |
| පැගිරි | - | - |
| වෙනත් | - | - |

**3.2.4.** එළවළු වගාව

| බෝගය | වගා කරන ලද බිම් ප්‍රමාණය අක්කර | වාර්ෂික අස්වැන්න කි.ග්‍රෑ. |
|---|---|---|
| මෑ | 63.25 | 209600 |
| බෝංචි | 3.25 | 8600 |
| බණ්ඩක්කා | 44.75 | 137300 |
| මාලු මිරිස් | 37.25 | 142000 |
| තක්කාලි | 24.25 | 79900 |
| වම්බටු | 64.25 | 266000 |
| තිබ්බටු | 10.25 | 41000 |
| එලබටු | 10.75 | 51600 |
| වැටකොළු | 41.25 | 150700 |
| පතෝල | 52 | 204000 |
| කරවිල | 27.25 | 115400 |
| දඹල | 23.75 | 67100 |

| | | |
|---|---|---|
| වට්ටක්කා | 33.25 | 152600 |
| කැකිරි | 49.25 | 223000 |
| පිපිඤ්ඤා | 56.25 | 272800 |
| අලුකෙසෙල් | 11.55 | 42700 |
| රාබු | 6.25 | 29600 |
| ගෝවා | 0 | 0 |
| වෙනත්(අළු පුහුල්) | 2 | 11600 |

**17**

### 3.2.5 අතිරේක ආහාර බෝග

| බෝගය | බිම් ප්‍රමාණය (අක්කර) | වාර්ෂික අස්වැන්න කි.ග්‍රෑම් |
|---|---|---|
| මඤ්ඤොක්කා | 44.5 | 94200 |
| බතල | 14.75 | 54500 |
| වෙනත් අල වර්ග | 6.2 | 1700 |
| අමුමිරිස් | 58.75 | 23500 |
| රටකජු | 660 | 396000 |
| බඩඉරිගු | 77.75 | 73350 |
| කුරක්කන් | 32.25 | 11550 |
| තල | 51.5 | 19900 |
| කවුපි | 99.8 | 35900 |
| සෝයා | 0 | 0 |
| උඳු | 623.5 | 207700 |
| රතුළූනු | 0 | 0 |
| මුං | 24 | 9600 |

### 3.2.6.භෝග වගාව හා සම්බන්ධ ගැටළු

1.වගාව සඳහා ප්‍රමාණවත් ජල පහසුකම් නොමැති වීම.

2.වගාවට ප්‍රමාණවත් පරිදි ඉඩකඩ නොමැති වීම.

3.වන අලින් හා වෙනත් සතුන්ගෙන් ඇති වන ගැටළු.

4.බෝගවගාවට ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැති වීම.

5. ස්වභාවික ගංවතුර උවදුරු

6.දීර්ඝ කාලීනව පවතින නියං තත්වයන්

### 3.2.7.භෝග වගාව ප්‍රවර්ධනය සඳහා කරන යෝජනා

1. වගාවන් සඳහා අවශ්‍ය වාරිමාර්ග හා ජල සම්පාදන ක්‍රම ක්‍රියාත්මක කිරීම(උදා - උස්සාන වාරිමාර්ග ක්‍රම).

2. විලෝපීය හාණි වැලැක්වීම සඳහා කටයුතු කිරීම (උදා- අලි වැට ඉදිකිරීම).

3. ගොවීන්ට අවශ්‍ය මූල්‍ය හා අනෙකුත් ප්‍රාග්ධන පහසුකම් සැපයීම.

4. නවීන තාක්ෂණික පහසුකම් ගොවීන් වෙත හඳුන්වා දීම

5. කෘෂි තාක්ෂණික දැනුම ගොවීන්ට ලබාදීම.

## 3.2.8. විසිතුරු පැළ හා මල්වගාව

| වගාව | වගා කරුවන් සංඛ්‍යාව | වාර්ෂික නිෂ්පාදනය(රු.) |
|---|---|---|
| ඇන්තූරියම් | 17 | 76000.00 |
| රෝස | 3 | මූලික අවධිය |
| ඕකිඩ් | 8 | මූලික අවධිය |
| විසිතුරු පැළ | 6 | මූලික අවධිය |
| වෙනත්(වර්ගය සඳහන් කරන්න) | - | |



## 3.2.9 පැලතවාන් - බීජ හා පැළ නිෂ්පාදනය

| බීජ හා පැළ නිෂ්පාදන වර්ගය | තවාන්කරුවන්සංඛ්‍යාව | වාර්ෂිකනිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) |
|---|---|---|
| බිත්තර වී | 16 | 46.41 |
| එළවළු හා පලතුරු | 02 | ආරම්භක අවධිය |

# 3.3 සත්ව පාලනය

## 3.3.1 පශු සම්පත් මධ්‍යස්ථාන තොරතුරු

| පශු සම්පත් මධ්‍යස්ථානයේ නම | ලිපිනය | පශු වෛද්‍ය නිලධාරියාගේ නම | දුරකතන අංකය |
|---|---|---|---|
| පශු වෛද්‍ය මධ්‍යස්ථානය | නිකවැරටිය | ඩබ්.එම්.ජ් වියජසූරිය | 0372260437 |

## 3.3.2 සත්ව පාලන සංඛ්‍යා දත්ත

| සතුන් වර්ගය | ගොවිපල සංඛ්‍යාව | | සතුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| | රජයේ | පෞද්ගලික | |
| කුකුලන් | - | 246 | 58510 |
| එළ ගවයන් | 01 | 1070 | 5043 |
| මී ගවයන් | 01 | 21 | 730 |
| ඌරන් | 0 | 16 | 2109 |
| එළුවන් | 0 | 46 | 338 |
| බැටළුවන් | 0 | 0 | 0 |
| කළුකුන් | - | - | - |
| වටුවන් | 0 | 6 | 525 |
| වෙනත් | - | - | - |

## 3.3.3 කුකුල් පාලනය-බිත්තර ලබා ගැනීම සඳහා

| ගොවිපල සංඛ්‍යාව | | සතුන් සංඛ්‍යාව | වාර්ෂික නිෂ්පාදනයබිත්තර |
|---|---|---|---|
| බිත්තර දමන කිකිළියන් | 232 | 34,310 | 2,265,230 |
| වටු කිකිලියන් | 06 | 500 | 90,000 |

| | | | |
|---|---|---|---|
| එකතුව | 238 | 34,935 | 2,355,230 |

### 3.3.4 සත්ව පාලනය - කිරි ලබා ගැනීම සඳහා

| සත්ව වර්ගය | සතුන් සංඛ්‍යාව | වාර්ෂික කිරි නිෂ්පාදනය(ලීටර්) | සතුන් ඇති කරන පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|
| මී ගවයන් | 310 | - | 21 |
| එළ ගවයන් | 2,685 | - | 1,071 |
| එළුවන් | - | - | |
| එකතුව | 2,995 | - | 1,092 |



### 3.3.5 සත්ව පාලනය-මස් පිණිස

| සත්ව වර්ගය | සතුන් සංඛ්‍යාව | වාර්ෂික මස් නිෂ්පාදනය(කි.ග්‍රෑ) | සතුන් ඇති කරන පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|
| මස් සඳහා කුකුළන්(බ්‍රොයිලර්) | 24,200 | 309,950 | 14 |
| කළුකුන් | - | - | - |
| ඌරන් | 2,106 | 15,900 | 16 |
| එළුවන් | 340 | 18,000 | 46 |
| ගවයන් | - | - | - |
| වෙනත් | - | - | - |
| | - | - | - |

### 3.3.6 පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන තොරතුරු

| වර්ගය | කර්මාන්ත සංඛ්‍යාව | සේවක සංඛාව |
|---|---|---|
| කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන | 38 | 38 |
| ශීතාගාර | - | - |
| යෝගට් නිෂ්පාදන ආයතන | 04 | සේවක සංඛ්‍යාව නිශ්චිතව දැක්විය නොහැක |
| අයිස්ක්‍රීම් නිෂ්පාදන ආයතන | 01 | |
| මුදවපු කිරි නිෂ්පාදන ආයතන | 02 | |
| කිරි බෝතල් කරන ආයතතන | 02 | |
| කිරි ආශ්‍රිත වෙනත් නිෂ්පාදන | - | |
| මස් ආශ්‍රිත නිෂ්පාදන | - | |
| වෙනත් | - | |

### 3.3.7 සත්ව පාලනය සම්බන්ධ වෙනත් සේවාවන්

| සේවාව | සංඛ්‍යාව | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|
| කෘත්‍රිම සිංචන සේවා | 1,336 | මෙම සේවා ලබාදීමේදී |
| අභිජනන තත්ත්ව පරීක්ෂණ | 351 | |

| | | |
|---|---|---|
| සත්ත්ව සෞඛ්‍ය උපදේශන | 1,393 | එකම ප්‍රතිලාභීන් සඳහා වර්ෂයතුල සේවාව ලබාදී ඇති බැවින් ප්‍රතිලාභීන් නිශ්චිත සංඛ්‍යාවක් පෙන්වා දිය නොහැකිය. |
| ව්‍යාප්ති සේවා | 08 | 1039 |
| පුහුණු වැඩසටහන් | 02 | 48 |
| සංවර්ධන ව්‍යාපාති/යටිතල පහසුකම | 04 | 08 |
| වෙනත් | - | - |



**3.3.8 මිරිදිය ධීවර කර්මාන්තය**

**3.3.8.1 ජල ජීවී මධ්‍යස්ථාන පිලිබඳ තොරතුරු**

| ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ව්‍යාප්ති නිලධාරියාගේ නම | සේවා ස්ථානයේ ලිපිනය | දුරකතන අංකය |
|---|---|---|
| කේ.එම්.ඒ. ඒකනායක | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, බිංගිරිය | 032-2245562 |

**3.3.8.2 මිරිදිය ධීවර කර්මාන්තය පිළිබද තොරතුරු**

| මිරිදියධීවර කර්මාන්තය සඳහා යොදාගෙන ඇති වැවේ නම | කාලීන/සෘතු ජලාශයන් | ජලාශයේ පරිමාව(අක්.අඩි.) | තොටුපළ සංඛ්‍යාව | ධීවර යාත්‍රා | | ධීවර පවුල් සංඛ්‍යාව | ධීවරයින් සංඛ්‍යාව | වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය (කි.ග්‍රෑ) | වාර්ෂික මිරිදිය ඉස්සන් නිෂ්පාදනය (කි.ග්‍රෑ) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ඔරු | තෙප්පම් | | | | |
| මාගල්ල වැව | නිත්‍ය | 263 | 3 | 17 | - | 36 | 36 | 52279 | 253 |
| හුළුගල්ල වැව | නිත්‍ය | 56 | 1 | 3 | - | 12 | 12 | 45263 | 98 |
| කිරිදිගල්ලවැව | නිත්‍ය | 46 | 3 | 5 | - | 15 | 15 | 47532 | 138 |
| කටගමුව වැව | කාලීන | 50 | - | - | - | 5 | 5 | 2385 | - |
| මැඩිල්ල වැව | කාලින | 80 | 1 | 2 | - | 7 | 7 | 2438 | - |

**3.3.8.3 මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ආශ්‍රිත රැකියා**

| වෘත්තිය | පුද්ගල සංඛ්‍යාව |
|---|---|
| මසුන් ඇල්ලීම | 85 |
| මත්ස්‍ය වෙළදාම-ජංගම | 18 |
| මත්ස්‍ය වෙළදාම -වෙළඳ සැල් | 12 |
| කරවල නිෂ්පාදනය | - |
| විසිතුරු මත්ස්‍ය වගාව | 18 |
| විසිතුරු මත්ස්‍ය වෙළදාම | 8 |

| | |
|---|---|
| විසිතුරු මත්ස්‍ය අපනයනය | - |
| ජලජ පැලැටි වගාව | - |
| ජලජ පැලැටි අපනයනය | - |
| ධීවර යාත්‍රා හා උපාංග නිෂ්පාදනය | - |

### 3.3.8.4 ධීවර සමිති

| අනු අංකය | ධීවර සමිතියේ නම | ලියාපදිංචි අංකය | සාමාජිකයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | මාගල්ල ග්‍රාමීය ධීවර සංවිධානය | - | 36 |
| 2 | හුලුගල්ල ග්‍රාමීය ධීවර සංවිධානය | - | 12 |
| 3 | කිරිදිගල්ල ග්‍රාමීය ධීවර සංවිධානය | - | 12 |
| එකතුව | | | 60 |



### 3.3.8.5 මත්ස්‍ය කර්මාන්ත ආශ්‍රිත තොරතුරු

I. මත්ස්‍ය අලෙවිසැල් සංඛ්‍යාව - 30
II. සුරතල් මසුන් අලෙවි සැල් සංඛ්‍යාව- 08
III. සුරතල් මසුන් ඇතිකරන ස්ථාන - 18
IV. මත්ස්‍ය සැකසුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව - නැත.
V. මිරිදිය මසුන් අභිජනනය කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව - නැත.
VI. මිරිදිය මසුන් ඇති කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව - නැත.
VII. ජලජ පැලැටි වගා ස්ථාන සංඛ්‍යාව - නැත.

### 3.3.8.6 ජලාශවල මසුන් තැම්පත් කිරීම

| අනු අංකය | ජලාශයේ නම | තැම්පත් කළ ඇඟිල්ලන් ගණන | තැම්පත් කළ ඇසිත්තන් ගණන | තැම්පත් කළ මිරිදිය ඉස්සන් ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | මාගල්ල වැව | 75000 | නැත. | 526000 |
| 2 | හුලුගල්ල වැව | 50000 | නැත. | නැත. |
| 3 | කිරිදිගල්ල වැව | 116200 | නැත. | නැත. |
| 4 | කටගමුව වැව | - | නැත. | නැත. |
| 5 | මැඩිල්ල වැව | - | නැත. | නැත. |
| එකතුව | | | | |

### 3.3.9 පශු වෛද්‍ය සේවා මධ්‍යස්ථාන

| සේවා ස්ථානයේ නම | ලිපිනය |
|---|---|
| පශු වෛද්‍ය කාර්යාලය | නිකවැරටිය |

### 3.9.10 සත්ව පාලනය හා සම්බන්ධ ගැටළු

1. තෘණ වගා කිරීම සඳහා අවශ්‍ය භූමිය ප්‍රමානවත් නොවීම.
2. කිරි අලෙවියේ දී අතර මැදියන් සම්බන්ධ වීම නිසා කිරි ගොවියාට නියමිත මිලක් නොලැබීයාම.
3. කුඹුරු අස්වනු නෙලීමේදී තාක්ෂණික යන්තත්‍ර සූත්‍ර භාවිතය නිසා පිදුරු අහාර සඳහා පිදුරු ලබා ගැනීමට නොහැකිවීම.

### 3.3.11 සත්ව පාලනය ප්‍රවර්ධනය සඳහා කරන යෝජනා

1. දියර කිරි අලෙවිය ප්‍රවර්ධනය කිරීම.
2. කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.
3. සත්ත්ව පාලනය සඳහා පෞද්ගලික අංශයට දැනට හිමි වී ඇති ස්ථානය රාජ්‍ය අංශයට ලබා දීම.
4. නව තාක්ෂණය භාවිතය වැඩි දියුණු කිරීම.
5.තත්වයන් උසස් කිරි දෙනුන් 50% දායකත්වයට ගොවීන් හට ලබා දීම.



# 4.ඉඩම් පරිහරණය

## 4.1කොට්ඨාසයේ මුළු වර්ග ප්‍රමාණය

| ව.කි.මී | හෙක්ටයාර් |
|---|---|
| 313 | 15236.79 |

## 4.2 භූමියේ අයිතිය අනුව

| වර්ගය(භූමියේ අයිතිය) | වර්ග ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|
| රජයේ ඉඩම්(රක්ෂිත) | 983.24 |
| රජයේ ඉඩම්(රක්ෂිත නොවන) | 6853.89 |
| පෞද්ගලික | 5006.73 |
| විහාර/දේවාල | 677.95 |
| වෙනත් | 1714.98 |
| එකතුව | 15236.79 |

## 4.3 භූමි පරිභෝජනය අනුව

| භූමි පරිභෝජනය | භූමි ප්‍රමාණය( හෙක්ටයාර) |
|---|---|
| 1.ප්‍රධාන වැවිලි | 2133.10 |
| 2.වෙනත් ස්ථිර භෝග | 1092.04 |
| 3.වී වගාව | 3837.92 |
| 4.වෙනත් කාලීන භෝග | 1983.89 |
| 5.ජලයෙන් යටවූ(වැව්,ජලාශ,වාරි මාර්ග,ගංගා) | 1785.48 |
| 6.රජයේ ඉඩම් | 2212.47 |
| 7.ගල් වගුරු සහිත මුඩු බිම් | 65.63 |
| 8.මාර්ග සඳහා | 469.57 |
| 9.සුසාන භූමි හා පොදු පරිභෝජනය | 75.34 |
| 10.ස්වභාවික හා වවන ලද කැලෑ ඉඩම් | 281.76 |
| 11.වෙනත් | 1299.59 |

| | |
|---|---|
| එකතුව | 15236.79 |

## 4.4 ඉඩම් අයිතියේ ස්වභාවය

| ඉඩම් අයිතියේ ස්වභාවය | පවුල් සංඛ්‍යාව | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | අක්කර0 .25ට අඩු | අක්කර0.26 -0.5 | අක්කර 0.51-1 | අක්කර 1.1-2.0 | අක්කර 2.1- 5.0 | අක්කර 5.1ට වැඩි | |
| සින්නක්කර ඉඩම් | 1737 | 1849 | 1328 | 903 | 510 | 79 | 6406 |
| මධ්‍යම පන්තික ඉඩම් | 0 | 0 | 0 | 0 | 0 | 5 | 5 |
| බලපත්‍රලාභී ඉඩම් | 686 | 577 | 841 | 1142 | 319 | 96.53 | 3662 |
| අනවසර ඉඩම් | 365 | 172 | 101 | 74 | 14 | 7 | 733 |
| වෙනත් ඉඩම් | 779 | 1074 | 744 | 504 | 264 | 234 | 3574 |

ඇමුණුම 12 ඉඩම් අයිතියේ ස්වභාවය



# 5 වාරි කර්මාන්තය

## 5.1වාරි කර්මාන්ත වර්ගීකරණය

### 5.1.1මහා පරිමාන වාරි කර්මාන්ත

| ග්‍රා.නිවසම | වාරි කර්මාන්තය | ජල ධාරිතාවය (අක්කර අඩි) | පෝෂක කුඹුරු ප්‍රමාණය (හෙක්ටයාර්) | වගා කරන පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මාගල්ලේගම | මාගල්ල වැව | 7480 | 7000 | 4290 |
| හුළුගල්ල | හුළුගල්ල වැව | 1235 | 240 | 202 |

### 5.1.2 මධ්‍ය පරිමාන වාරි කර්මාන්ත

| ග්‍රා.නිවසම | වාරි කර්මාන්තය | ජල ධාරිතාවය (අක්කර අඩි) | පෝෂක කුඹුරු ප්‍රමාණය (හෙක්ටයාර්) | වගා කරන පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| නැත | | | | |

### 5.1.3. කුඩා පරිමාණයේ වාරි කර්මාන්තය

| වැව් අමුණු සංඛ්‍යාව | ජල ධාරිතාවය (අක්කර අඩි) | පෝෂක කුඹුරු ප්‍රමාණය (අක්කර) | වගා කරන පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|
| වැව් -378<br>අමුණු-11 | 7548.38 | අක්කර3866 රූඩ්3 පර්චස්1 | 6474 |

### 5.1.3 ඇමුණුම (13) වැව් අමුණු පිළිබඳ තොරතුරු

## 5.2 කෘෂි ළිං

| කොට්ඨාශයේ කෘෂි ළිං සංඛ්‍යාව | වගා කරන භූමි ප්‍රමාණය (අක්කර) |
|---|---|
| 254 | 370.55 |

**ඇමුණුම (14) කෘෂි ළිං**

**5.3 කෘෂිකාර්මික වාරි ජල සම්පාදනය පිළිබඳ පවතින ගැටළු:-**

1. **වාරිකර්මාන්ත වල පවතින ජලය ප්‍රමාණවත් නොවීම**
2. **වේලි පද්ධතිය ප්‍රතිසංස්කරණය කර නොමැතිවීම**
3. **ගොවි සංවිධාන විසින් අදාල වාරිමාර්ග නිසි පරිදි නඩත්තු නොකිරීම.**

**5.4 කෘෂිකාර්මික වාරි ජල සම්පාදනය පිළිබඳ පවතින යෝජනා :-**

**1. වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම.**
**2. කලට වෙලාවට වාරිමාර්ග පද්ධති නඩත්තු කටයුතු සිදු කිරීමේ වැදගත්කම පිලිබඳව ගොවි සංවිධාන දැනුවත් කිරීම.**

## 5.5කොට්ඨාශය හරහා ගලායන ඇල,දොළ,ගංඟා පිළිබඳ විස්තර

| ඇල,දොළ ,ගංඟාවේ නම | කෙට්ඨාශයට අයත් කොටසේ දිග (කිලෝ මීටර) |
|---|---|
| දැදුරු ඔය | 24 |
| වාරි ඇල | 44 |
| කුඩා ඔය | 10 |



# 6කර්මාන්ත

## 6.1 කර්මාන්තපුර

| කර්මාන්ත පුරයේ නම | කර්මාන්ත පුරයේ අයිතිය(BOI/ISB) | විශාලත්වය අක්කර | කර්මාන්ත ශාලාවේ නම | සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| නැත | නැත. | - | - | - |

## 6.2 අපනයන ගම්මාන

| අනු අංකය | නම | ලිපිනය | නිෂ්පාදනය | සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| නැත | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

**6.3 කර්මාන්තශාලා වර්ගීකරණය අනුව**

**6.3.1මහා පරිමාන කර්මාන්ත ශාලා**

| අනු අංකය | නම හා පිහිටි ස්ථානය | නිෂ්පාදන වර්ග | සේවක සංඛ්‍යාව |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |

## 6.3.2 මධ්‍ය පරිමාන කර්මාන්ත ශාලා

| අනු අංකය | නම හා පිහිටි ස්ථානය | නිෂ්පාදන වර්ග | සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ඇල්ෆයින් ක්ලෝතින් පුද්ගලික සමාගම් ඇලවක, නිකවැරටිය | ඇගලුම් | 705 |
| 2 | ඇල්ෆයින් ක්ලෝතින් පුද්ගලික සමාගම මාගල්ලේගම, නිකවැරටිය | ඇගලුම් | 540 |
| 3 | JMK ප්ලාස්ටික් ආයතනය-දළුක්ගොල්ල, නිකවැරටිය | ප්ලාස්ටික් භාණ්ඩ | 23 |
| 4 | ආර්.බී. හාල් මෝල (වන්නි මුතු සම්බා ) හුලෝගෙදර | සහල් | 30 |
| 5 | වර්ල්ඩ් විෂන් ගාමන්ට් ඔළුපැලියාව | ඇඟළුම් | 70 |
| 6 | දිවුල්ලැගොඩ කොහුබත් | කොහුබත් | 10 |
| 7 | සුපුන සහල් මෝල් හුලෝගෙදර | සහල් | 08 |



## 6.3.3 සුළු පරිමාන කර්මාන්ත ශාලා

| අනු අංකය | නම හා පිහිටි ස්ථානය | නිෂ්පාදන වර්ග | සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | නෙළුම් ෆාම් හුලෝගෙදර | බිත්තර | 08 |
| 2 | ජයසේන හාල් මෝල-හුලෝගෙදර | සහල් | 03 |
| 3 | තුෂාරී හාල් මෝල -හුලෝගෙදර | සහල් | 04 |
| 4 | ඩිලයිට් කර්මාන්තශාලාව | යෝගට් | 08 |
| 5 | සිරිපාල-ගලගෙදර | කොහුබත් | 04 |
| 6 | පුබුදු නිලගේ -ගලගෙදර | කොහුබත් | 02 |
| 7 | එන්.කේ.එච්.ප්‍රේමදාස-කළුවැන්නැව | පොල් ලෙලි කැබලි | 02 |
| 8 | ජයසූරිය ,ගනේවැව | පොල්ලෙලි කැපීම | 04 |
| 9 | 77 නිවස -තරණගොල්ල | කොහු | 18 |
| 10 | නයිස් කිරි නිෂ්පාදන | කිරි ආශ්‍රිත නිෂ්පාදන | 06 |

